දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXD/05/2024

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2024/03/ 25
Date )

පොදු චක්‍රලේඛ ලිපි අංක - 02-51/2024

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල,
අධ්‍යක්ෂ - ජාතික රෝහල, මහනුවර
ෆෙඩරල් අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයේ අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2024 (පළමු වාරය)**

අතුරු වෛද්‍ය සේවයේ අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරීන්, II ශ්‍රේණියට උසස්වී වසර 3 ක් ගතවීමට පෙර සමත් විය යුතු **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** 2024.05.18 හා 2024.05.19 යන දිනයන්හිදී සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. **(විෂයානුබද්ධ ප්‍රශ්නපත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.)** විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02 **සුදුසුකම් :**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ අක්ෂි තාක්ෂණවේදී II ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරීන් පමණි.

**සැ.යු. :-2024.04.22 දින වන විට II ශ්‍රේණියට පත්කර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මාවෙත එවීමට කටයුතු කරන්න. (II ශ්‍රේණියට පත්කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්ය වේ.)**

03 **අයදුම්පත් :-**

මෙම චක්‍රලේඛ ලිපියේ අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශය අධ්‍යක්ෂ (විභාග) වෙත **2024.04.22** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"අක්ෂි තාක්ෂණවේදී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** 2024 **(පළමු වාරය)"** ලෙස සඳහන් කළ යුතුය. **මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියා විසින්ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින්ද සහතික කර තිබීම අනිවාර්යය වේ.** තම අයදුම්පත සමඟ රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 110.00 ක් වටිනා මුද්දර ඇලවූ "9X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. **ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

සැ.යු : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට **අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01-04 දක්වාත්, දෙවන පිටුවේ අංක 05 - 09 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. විභාග ගාස්තු

1. විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

2. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. විභාගයට ඇතුළත් කර ගැනීම

1. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට /අපේක්ෂිකාවන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

2. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

   (අ) ජාතික හැඳුනුම්පත
   (ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරනු ලබන හැඳුනුම්පත
   (ඇ) වලංගු රියදුරු බලපත්‍රය
   (ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

06 විභාග පරිපාටිය

මෙම විභාගය **දෙපාර්තමේන්තු පරීක්ෂණය** සහ **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය** යනුවෙන් කොටස් දෙකකි. දෙපාර්තමේන්තු පරීක්ෂණය විෂයානුබද්ධ ලිඛිත, ප්‍රායෝගික සහ වාචික වශයෙන් කොටස් තුනකින් යුක්ත වන අතර එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා කාලය පැය 02 කි. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කරන අතර සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගත යුතුය. මෙම විභාගය එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් / විෂයන් වශයෙන් පෙනී සිට සම්පූර්ණ කළ හැකිය. පළමු වරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියළුම විෂයන් අයදුම් කළ යුතුය.

07 විෂය නිර්දේශ මාලාව

07.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය

07.1.1 විෂයානුබද්ධ ලිඛිත

කාලය පැය 03 කි. රචනා මාදිලියේ ප්‍රශ්න 08 කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

**විෂය නිර්දේශය**

**Optometry**

- Laws that govern reflection and refraction
- Types of lenses
- Draw and label prism
- Meaning of the snellen fraction
- Modifications of 6 meter chart for other distances
- Relate snellen fraction to visual tasks
- Theory of retinoscopye
- Use of the streak retinoscope
- The optical cross
- Custom in Prescription writing
- Prentice's rule: Lense prism relationship

**Orthcopitcs**

- Extra ocular muscle actions
- Testing ocular movements
- The cover test cover, uncover test in manifest squints
- Types of convergence 1, 2, 3
- Convergence and accommodation relationship measurements gradient method
- Classification of ET and XT
- Cover test latent squint
- Latent squint exophoria
- Management of phorias
- How to perform tests used to investigate squints
  - Bagolini striated lenses
  - Worth lights
  - Stereotests
  - Major amblyoscope
- Grades of binocular vision
- How to check the visual acuity in small children and infants
  - Good vision in both eyes
  - Poor vision in one eye
- Types of amblyopia
- Treatment of types of amblyopia
- Investigation of content ET with:
  - NRC,
  - ARC,
  - Suppression
- Relate intermittent squints to ACA ratio
- Management of Intermittent squint
  - 1.Convergence excess ET
  - 2.Fully accommodative ET
- Sherrington's law
- Hering's law
- Parlytic Sequence
- Testing ocular movement in paralytic squints
  - Cover test
  - BSV
  - Hess

**07.1.2 විෂයානුබද්ධ වාචික පරීක්ෂණය** - විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේ දී මුහුණපාන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාළ වන විෂය නිර්දේශය මෙයට අදාළ වේ. (කාලය විනාඩි 15 යි.) මුළු ලකුණු 100කි.

**07.1.2 විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය** - විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාළ වන විෂය නිර්දේශය මෙයට අදාල වේ. (කාලය පරීක්ෂණය අනුව) මුළු ලකුණු 100කි.

**07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07.2.1 ආයතන සංග්‍රහය**

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ. රචනා මාදිලියේ ප්‍රශ්න 07 කින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය හැකිය. කාලය පැය 02 කි. මුළු ලකුණු 100 කි.

- Distance and vergence change, concept, lens addition thick, lens back vertcx distance
- Labelling of prisms
- Eye as an optical instrument
- The different kinds of refractive error
- Clinical signs and symptoms of :Myopia, Hypermetropia and Astigmatism presbiopia
- Relate these conditions to age
- Describe the physiological reaction of the visual system to these
- Draw and label the interval of sturm
- Subjective refracton 5 Steps
- Prescribing for visual defects
- Case example
- Management of the low vision patient
- The 2 causes of visual problems in anisometropia and rule of thumb in dealing with it
- Describe " meridional magnification
  meridional anisometropia
- Calculate induced prism as a result of anisometropia and suggest solution.
- Rule of thumb for lens induced prism
  - 2 Vertical
  - 3 base in
  - 4 base out

- Pseudophakia
  Rcading corrections
  astigmatism
- Biometry - A scan
  - B scan
  - Contact lens manufacturing
  - Uses
  - Complications and maintenance

**Visual Fields**

- Know technique for confrontation
- Tangent Screen
- Goldmann Perimetry
- Humpry field analyzer
- Characteristic Field effects on
- Glaucoma
- Papillitis
- Papilloedema
- Nutritional Amblyopia
- Retinitis Pigmentosa
- Pituitary pressure on the optic chiasm
- Posterior neurological defect

**Pharmacology**

- Know the drugs commonly used in ophthalmic diagnosis, their action, dosage, duration, precautions
- Know the drugs commonly used in Glaucoma, action dosage precautions
- Know the Ophthalmic drugs on the government hospital inventory and their usage
- Compare the sympathetic and parasympathetic nervous system as to the actions of the organ they stimulate
- Name the chemical transmitters in these systems and how their action is stopped
- Know the ocular side effects of these commonly used systemic drugs

❖ ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.

| | | |
|---|---|---|
| XV | පරිච්ඡේදය | - අධ්‍යයනය, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම. |
| XVI | පරිච්ඡේදය | - නිවාඩු ගමන් |
| XXIII | පරිච්ඡේදය | - ඇතැම් වර්ගවල රෝගවලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහය සහ ඒ පිළිබඳ කොන්දේසි. |
| XXIV | පරිච්ඡේදය | - වැටුප් ණය සහ අත්තිකාරම් |
| XXV | පරිච්ඡේදය | - වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය. |
| XXVII | පරිච්ඡේදය | - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග. |
| XXVIII | පරිච්ඡේදය | - පරිපාලන කාර්යපරිපාටි සහ විධි |
| XXX | පරිච්ඡේදය | - රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල. |
| XXXIII | පරිච්ඡේදය | - නීති උපදෙස් සහ නීති ක්‍රියාමාර්ග. |
| XLVII | පරිච්ඡේදය | - සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII | පරිච්ඡේදය | - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති. |

**07.2.2** මුදල් රෙගුලාසි

මෙම ප්‍රශ්නපත්‍රය සඳහා කාලය පැය 02 කි. රචනා මාදිලියේ ප්‍රශ්න 07 කින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය හැකිය. මුළු ලකුණු 100 කි.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

**VI වන පරිච්ඡේදය** - ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය සහ බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්,
**(මු රෙ 315 සිට මු රෙ 396 දක්වා)**

**XIII වන පරිච්ඡේදය** - සැපයුම් වැඩ සහ සේවා:- සැපයීම් / මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙණ්ඩර පරිපාටියෙන් බැහැර වීම,
**(මු රෙ 708 සිට මු රෙ 775 දක්වා)**

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලාගෙන උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ නියුතු සියලුම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවයේ අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

**Web path : www. health. gov.lk ⟶ Staff Access ⟶ Administration ⟶ Examination ⟶ Circulars**

**සැ.යු - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බල පැවැත්වේ.**

(අත්සන)

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන II)
ලේකම් වෙනුවට

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

EXD

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ (MT-06) වැටුප් පරිමාණයේ අතුරු වෛද්‍ය සේවයේ අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2024 (පළමු වාරය)**

01. (අ) I අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) ........................................................................................

........................................................................................................................................

II අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්,)

III මුලකුරු සමඟ නම (සිංහලෙන්) ........................................................................................

........................................................................................................................................

IV මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) I. II ශ්‍රේණියට උසස් කළ හෝ අන්තර්ග්‍රහණය කළ ලිපි අංකය: ........................................................

දිනය :-..........................................................

(II ශ්‍රේණියට උසස් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් මේ සමඟ අමුණන්න)

II. දැනට ලබන වාර්ෂික වැටුප ........................................................................................

III. ජංගම දුරකථන අංකය

IV . ජාතික හැඳුනුම්පත් අංකය

V . විද්‍යුත් ලිපිනය ........................................................................................

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- විෂයානුබද්ධ ලිඛිත
- විෂයානුබද්ධ ප්‍රායෝගික
- විෂයානුබද්ධ වාචික

03. (අ) දැනට සේවය කරන ආයතනය ........................................................................................

(ආ) එම ආයතනය අයත් වන්නේ - මධ්‍යම රජයට -

- පළාත් සභාවට -

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත ........................................................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය ........................................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"X4" ප්‍රමාණයේ රු. 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පතට අමුණන ලද්දේද? ..........................................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන්) ........................................................................................

........................................................................................................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ........................................................................................

........................................................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය (සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ) ........................................................................................

(ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍ර සඳහා)

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..............................................................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද?............................................................

| |
|---|
| මුද්දර කොටුව |

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන බැවින් රු. ..............ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත්, ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

.................................... ............................................

දිනය අයදුම්කරුගේ අත්සන

07. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිනියගේ සහතිකය**

මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර ඇති බවත්, II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනු කළ බවත් සහතික කරමි.

.......................................... ..........................................

දිනය නම සහ අත්සන

08. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..............................මහතා/ මහත්මිය / මෙනවිය .................................. නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත්, විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, රු........ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීම අනවශ්‍ය බවද අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්,මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි

........................ ..................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

09. **විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

..........................................................................................මහතා/ මිය/ මෙනෙවිය **අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි II ශ්‍රේණියේ නිලධාරියෙකු** වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

.................................................... ................................

දිනය විමධ්‍යගත කොට්ඨාශ/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(මුද්‍රාව තැබිය යුතුය)

(අනවශ්‍ය කොටස් කපා හරින්න)